# දඹදෙණි යුගයේ රාජ්‍ය ආරක්ෂක ව්‍යුහය

ජේ.එම්. සුධර්මාවතී, ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

J.M. Sudharmawathi, Department of History, University of Kelaniya

ලංකා ඉතිහාසයේ එන යුග බෙදීම් අනුව ගත්විට එක් යුගයක් වූයේ දඹදෙණිය අවධියයි. වසර එක් දහස් පන්සියයක් පමණ කාලයක් තුළ ව්‍යාප්තව පැවති රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් අනතුරුව දේශපාලන නායකත්වයක් ගොඩනැගෙනු දැකිය හැකි පළමු වන අවස්ථාව වූයේ දඹදෙණිය කේන්ද්‍ර කරගෙන පාලන මධ්‍යස්ථානය පිහිටුවා ගැනීමයි. එය නව යුගයක ආරම්භය සඳහා දැමූ ශක්තිමත් පදනම ලෙස ද සඳහන් කළ හැකියි.

අනුරාධපුර යුගයේ පටන් ම මෙරටට එල්ල වූ ආක්‍රමණ බිඳ හෙළීම සඳහා සිංහල පාලකයෝ සමත් වී ඇත්තේ ඔවුන් අනුගමනය කළ ආරක්ෂක විධිවිධාන හේතුවෙන් බව පැහැදිලි වේ. අභ්‍යන්තර කැරලි මැඩ පැවැත්වීමට විදේශ ආක්‍රමණවලට මුහුණ දීමට ශක්තිමත් ආරක්ෂක උපක්‍රම අනුගමනය කර තිබෙන ආකාරය එවන් අභියෝග ජයගත් සංසිද්ධීන් තුළින් අවබෝධ වෙයි. රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමට හේතු වූ බිහිසුණ දේශපාලන වාතාවරණය දීර්ඝව කාලීනව  එම අභියෝග බිඳහෙළමින් පසුකාලයේදී ද ඇති වූ ආක්‍රමණයන්ට දඹදෙණි රජවරු මුහුණ දුන් ආකාරය හා අනුගමනය කළ ආරක්ෂක ක්‍රම නැතහොත් ඔවුන් ගොඩනැගූ ආරක්ෂක ව්‍යුහය පරීක්ෂා කිරීම මෙහි වූ පර්යේෂණ ගැටළුවයි.

ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය පරිශීලනය කරමින් ද පුරාවිද්‍යාත්මක සාධක උපකාරී කරගනිමින් ද මෙම පර්යේෂණයේ දී දත්ත එක්රැස් කරගන්නා ලදී.

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ ප්‍රස්තුත අවධියේ පාලකයන් ඇති කළ ආරක්ෂිත ව්‍යුහය පිළිබඳව පරීක්ෂා කර බැලීමයි. බිහිසුණු ආක්‍රමණිකයෙකු ලෙස සැලකිය හැකි මාඝගේ පීඩනයන්ට ගොදුරුව සිටි ලංකිකයෝ අසරණ තත්ත්වයකට පත් කරමින් උතුරු ප්‍රදේශයේ දීර්ඝ කාලයක් ආක්‍රමණිකයා රැඳී සිටියදී ම, දඹදෙණිය කේන්ද්‍ර කර ගනිමින් තුන්වන විජයබාහු රජු නායකත්වය ගන්නා ලදී. එතුමා අනුගමනය කළ ආරක්ෂක විධි විධාන හා ඒ ඔස්සේ අනුප්‍රාප්තිකයන් කෙලෙස කටයුතු කළා දැයි පරීක්ෂා කරනු ලැබීය.

තුන්වන විජයබාහු රජතුමා වන්නි පාලකයෙකු ලෙස දේශපාලන ගමන්මග ආරම්භ කරමින් මායා රටේ පාලකයා බවට පත් වීම ඉතාම වැදගත් සිදුවීමක් විය. දේශීය වශයෙන් සිටි ප්‍රාදේශීය නායකයින් අවනත කර ගනිමින් උතුරේ සිටි ආක්‍රමණිකයාට එරෙහිව ක්‍රියා කිරීම සඳහා කිසියම් දීර්ඝකාලීන වැඩ පිළිවෙලක් සකස් කිරීමට එතුමා සමත් වූ බව පැහැදිලි ය. ඔහුගේ වැඩිමහල් පුත් වූ දෙවන පරාක්‍රමබාහු රජතුමා ඒ මග ඔස්සේ ගමන් කරමින් ක්‍රියා කළ අන්දම රාජ්‍යය හා රටවැසියා ආරක්ෂා කළ අයුරින් පැහැදිලි වේ. ඔහුගේ අනුප්‍රාප්තිකයෝ ද එයින් බැහැර නොවූහ.

පැවති දේශපාලනමය ස්වරූපය අනුව මෙරට අනාරක්ෂිත තත්ත්වයෙන් ඇතිවූ භීතියෙන් යුතුව රට වැසියන් වාසය කරමින් සිටි සමයේ රට රැකගැනීම සඳහා පාලකයන් ක්‍රියාත්මක කළ යුද්ධමය විධික්‍රම අතර පළමුවරට රාජධානිය පිහිටුවා ගැනීම සඳහා සුදුසු පරිසරයක් ඇති ස්ථානයන් යොදා ගැනීමට සමත් වූ බව පැහැදිලි වේ. ඒ වගේ ම රැඳී සිටි බිහිසුණු ආක්‍රමණිකයා වූ මාඝ පළවා හැරීමටත්, චන්ද්‍රභානු සහ පාණ්ඩ්‍යයන් යන ආක්‍රමණිකයන් මෙහෙයවූ ප්‍රබල ආක්‍රමණ පරාජය කිරීමටත් සමත් වූ බලවේග ක්‍රියාත්මක කිරීමට දඹදෙණි යුගයේ පවත්වාගෙන ගිය ආරක්ෂිත ව්‍යුහය තුළින් හැකි වූ බව නිගමනය කළ හැකිය.

මුඛ්‍ය පද - දඹදෙණි යුගය, රජවරු, ආරක්ෂක ව්‍යුහය, රාජධානිය, ආක්‍රමණ